ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1991 අංක 12 දරන සෙරන්ඩිබ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 13 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1991 මාර්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00

# 1991 අංක 12 දරන සෙරන්ඩිබ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 60/89

## සෙරන්ඩිබ් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"සෙරන්ඩිබ් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති ඊතිවලට අනුකූලව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු කාර්ය සාධක ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මේ දක්වා කින්නියාවේ පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද: පූර්විකාව.

තවද, එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා ද එකී සියලු පරමාර්ථ සහ කරුණු එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු ලැබ සහ ඉටු කරනු ලැබ ඇති හෙයින් සහ මෙහි මින් මතු සඳහන් කරනු ලබන විධිවිධානවලට අනුකූලව සංස්ථාගත කරනු ලැබීම සඳහා එකී පදනම විසින් ඉල්ලුම් කරනු ලැබ ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1991 අංක 12 දරන සෙරන්ඩිබ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සෙරන්ඩිබ් පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් ලෙස බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "සෙරන්ඩිබ් පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේය. තවද, ඒ සංස්ථාව විසින් සහ එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම කළ හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ භාවිත කිරීමේද තම කැමැත්ත අනුව එය වෙනස් කිරීමේ සහ අමුතු කිරීමේ ද සම්පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය. සෙරන්ඩිබ් පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පරමාර්ථ ඉටුකිරීම සඳහා ද ඒ පරමාර්ථ මෙසේ යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) අධ්‍යාපන ආයතන පිහිටුවා, නඩත්තු කිරීමෙන් සහ ශිෂ්‍යත්ව ඇති කිරීමෙන් අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය පරපුරේ පොදු ශුභසාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම ;

(ඈ) අන්තර් වාර්ගික සමගිය නංවාලීම, ප්‍රවර්ධනය කිරීම සහ එකී සමගිය ඇති කිරීම පිණිස දිරිගැන්වීම ;

(ඉ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහාය, පෝෂණාහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස සැපයීම;

(ඊ) අඳ, ගොළු සහ බිහිරි තැනැත්තන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම සහ වැඩිහිටි නිවාස පිහිටුවීම; සහ

(උ) සංස්කෘතික කටයුතුවල යෙදීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත දැක්වෙන බලතල ඇත්තේ ය:—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදල් සොයා ගැනීම මුදලින් හෝ වෙනත් දේවල් වශයෙන් ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාගයන් ලබාගැනීම;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් ඕනෑම ආකාරයකින් අත් කර ගෙන දැරීම, බද්දට ගැනීම හෝ දීම, කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ වෙනත් ආකරයකින් බැහැර කිරීම;

(ඇ) සංස්ථාවේ මුදල් වැඩි ආදායමක් හෝ ලාභයක් ගෙන දේ යයි සිතිය හැකි ආයෝජනවල ආයෝජනය කිරීම සහ එවැනි ආයෝජනය කිරීම් ආපසු ගැනීම, ප්‍රතිආයෝජනය කිරීම හෝ වෙනස් කිරීම;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගෙන යාම සඳහා අවශ්‍ය වන කපිකාචාර්යවරුන්, ගුරුවරුන්, නිලධරයන් සහ සේවකයන්, සේවයේ නිරත කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හෝ අස් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ මුදල් සොයා ගැනීම; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

5. (1) සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් ලෙස සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර සංස්ථාවේ ලාභ හෝ ලාභාංශ කිසිවක්වේ නම් ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය.

(2) සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විටක, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවනු ලැබීමෙන් පසුව ඉතිරිවන සියලු වත්කම් හුදෙක් පුණ්‍ය කාර්යයක් හෝ අධ්‍යාපනික කාර්යයක් සඳහාම පිහිටුවනු ලැබ ඇති හෝ සංවිධානය කරනු ලැබ ඇති යම් අරමුදලක හෝ සංවිධානයක සහපත සඳහාම පමණක් පවරා දෙනු ලැබිය යුතු ය.

සංස්ථාව දේශපාලන කටයුතුවල නිරත නොවිය යුතු බව.

6. සංස්ථාවේ කටයුතුවල කොටසක් ලෙස යම් අපේක්ෂකයකු හෝ දේශපාලන පක්ෂයක් වෙනුවෙන් නීති සම්පාදනයෙහිලා බලපෑමක් ඇති කිරීම පිණිස ප්‍රචාරක කටයුතු කිරීම හෝ එවැනි බලපෑමක් ඇති කිරීම සඳහා වෙනත් ආකාරයකින් තැත් කිරීම හෝ සංස්ථාව විසින් නොකළ යුතු ය.

සංස්ථාවේ බලතල සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

7. (1) සංස්ථාවේ රීතිවලින් තත් කාර්යය සඳහා විධිවිධාන සලසා ඇති පරිදි තෝරා ගනු ලබන සභාපතිවරයකුගෙන් සහ එසේ විධිවිධාන සලසා ඇති පරිදි පත් කරනු ලබන සාමාජික සංඛ්‍යාවකින් යුක්ත පාලක මණ්ඩලයක් විසින් සංස්ථාවේ බලතල එකී රීතිවලට යටත්ව ක්‍රියාත්මක කළ යුතු අතර සංස්ථාවේ කටයුතු එකී රීතිවලට යටත්ව කළමනාකරණය කළ යුතු ය.

(2) මේ පනතේ උපලේඛනයේ නම් සඳහන් කරනු ලැබ ඇති තැනැත්තන් පළමුවන පාලක මණ්ඩලයේ සාමාජිකයන් විය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ මුද්‍රාව පාලක මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු අතර, පාලක මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ ඒ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, ඒ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තවද තමන් පැමිණ සිටි බවට සාධකයක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල සහ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තවද සංස්ථාවේ රීතිවලට යටත්ව, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති, පදනමේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර පදනමට අය විය යුතු සියලුම ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

11. (1) පාලක මණ්ඩලය විසින් කලින් කල එකී මණ්ඩලයේ යම් රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් සඳහා මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) පාලක මණ්ඩලයේ සභාපතිවරයා සහ එහි සෙසු සාමාජිකයන් තෝරා පත් කිරීම :

(ආ) කථිකාචාර්යවරුන්, ආචාර්යවරුන්, නිලධරයන් සහ සේවා නියුක්තයන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම සහ ඔවුන් නෙරපීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම සහ ඒ ගිණුම් ක්‍රියාත්මක කිරීම ;

(ඈ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ මුදල්වල භාරකාරත්වය සහ එකී ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම ;

(ඉ) සංස්ථාවේ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පරිපාටිය ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ සාදන ලද කවර වුවද රීතියක් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## උපලේඛනය

(7 (2) වන වගන්තිය)

1. ඒ. එස්. එම්. හනීෆා
2. එම්. එච්. හිලාලි මජීඩ්
3. එස්. එම්. ඒ. හසන්

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙතින් සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ජන. 1 සිට වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.